# පාලි සුත්‍රපිටකය පෝෂණයෙහිලා ස්ත්‍රී දායකත්වය

විමල් හේවා මානගේ

## පූර්විකය

ස්ත්‍රී භාවය පිළිබඳ කෙරෙන නූතන සමාජ සාහිත්‍යයේ ආගමික ඉගැන්වීම් කෙරෙහි දක්වන ආකල්පය එතරම් යථාර්ථවාදී නොවන බව පෙනෙන අතර, විශේෂ අශුභවාදී දිශාවකට ද යොමු වන බව පෙනේ. එලෙස අශුභවාදීත්වයට එකාන්ත නැඹුරු වීමෙහිලා ඇතැම් ආගමික ඉගැන්වීම් හා විශේෂයෙන් එහි අධිකාරීත්වය පවත්වන්නන්ගේ ආකල්ප ද යම් පමණකට බලපා තිබේ. සෑම ආගමක ම ස්ත්‍රිය පිළිබඳ විමර්ශනයක් ඇතුළත් වන අතර, ඒවා අඩු වැඩි වශයෙන් ප්‍රගතිශීලී හෝ ප්‍රතිගාමී වේ. මෙහි අවධානය යොමු කෙරෙන්නේ බුද්ධසමය වෙත පමණක් බව සැලකිය යුතු ය. එහි දී ද බුද්ධසමය ස්ත්‍රීත්වය සම්බන්ධයෙන් දරන ආකල්පය විමර්ශනයට නොව පාලි සූත්‍රපිටකය පෝෂණයෙහි ලා ස්ත්‍රීන්ගෙන් ලැබී ඇති දායකත්වය විමර්ශනය කිරීමට සීමා කෙරේ. එම සාකච්ඡාවෙන් ස්ත්‍රිය පිළිබඳ ථේරීය සම්ප්‍රදාය නගන තර්ක විතර්කවල යුක්ති යුක්තභාව උක්ත ප්‍රස්තුතයට අදාළව එනම් සූත්‍ර පිටකයෙහි හමුවන දාර්ශනික, සාහිත්‍යාත්මක හා ආචාරවිද්‍යාත්මක දායකත්වය ස්ත්‍රී භාෂිත ආශ්‍රය කර ගනිමින් පරීක්ෂා කිරීමට පර්යේෂකයන්ගේ අවධානය යොමු කෙරේ. මෙහි දී භික්ෂුණී භාෂිත ස්ත්‍රී භාෂිත සේ එහි බාහිර අර්ථයෙන් වියුක්ත සැලකිය හැකි ය. එහෙත් මෙහි හමුවන ස්ත්‍රීන් හුදු ස්ත්‍රීන් පමණක් නොවන බව ද මෙහිලා අවධාරණය කළ යුතු ය.